## ආයතනයක වගතුග



මහරගම ජාතික තරුණසේවා මධ්‍යස්ථානය
බෙල්වුඩ් සෞන්දර්ය ආයතනය
සහස්‍රා, රැකියා තොරතුරු මධ්‍යස්ථානය

# උතුරු-දකුණු තරුණ පෙළ එක් කරන ජාතික තරුණ සේවා සභාව

නව යොවුන් වියත් වැඩිහිටි වියත් අතර අවධිය තරුණ විය ලෙස අපි දනිමු. තමන්ගේ ඉදිරි ජීවිතය ජය ගැනීමට යා යුතු මග හා ඉලක්කයන් පිළිබඳ ආකල්පයන් ඇති කරගැනීම සිදුකැරෙන වකවානුව මෙන්ම ආර්ථික ස්වාධීනත්වය ඇති කරගැනීමට තම තමන්ගේ කටයුතු ස්වාධීනව කර ගැනීමට සූදනම් වූ අවස්ථාව තරුණවිය යි.

1979 අංක 69 දරණ ජාතික තරුණසේවා සභා පනත මගින් ස්ථාපිත කරන ලද ජාතික තරුණසේවා සභාව එම තරුණ පිරිස වෙනුවෙන් ඇරඹුන ආයතනයකි.

ශ්‍රී ලාංකීය තරුණ පරපුරේ අවශ්‍යතාවන් සපුරාලමින් සේවා සැපයීමේ පෘථුල කාර්යභාරය ඉටුකරන ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතනය ලෙස වර්තමානයේ ජාතික තරුණසේවා සභාව හඳුන්වා දීමට පුළුවන.

දිවයිනේ වෙසෙන ජනගහනයෙන් 1/3 කට වැඩි ප්‍රමාණයක් එනම් ලක්ෂ 50 ක් පමණ වන පිරිසක් ජාතික තරුණසේවා සභාවේ සේවය ලබා ගන්නා පිරිසට අයත් වේ. විශේෂයෙන්ම වයස් කාණ්ඩ හැටියට ගතහොත් වයස අවුරුදු 17 ත් 29 ත් අතර කාණ්ඩය මෙම පිරිසට අයත් යැයි ගැනේ.



සභාපති නන්දසිරි ගමගේ මහතා

2000 වසරේ සිට යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික තරුණ සේවා සභාවේ වත්මන් සභාපති / අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස නන්දසිරි ගමගේ මහතා කටයුතු කරයි. 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පණත යටතේ මෙම ආයතනයේ කාර්ය ක්ෂේත්‍රය පුළුල් ලෙස ව්‍යාප්තව ඇති අතර, එම පනතේ සඳහන් පහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙමආයතනයේ කාර්යභාරයයි.

### අරමුණු

01. ජාතික හැඟීම පිළිබඳ උද්‍යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණ පරපුර අතර පෝෂණය කිරීම

02. ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම

03. ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල තරුණ පෙළ අතර සුහදතාව සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම

04. තරුණ පෙළ අතර




උතුරු දකුණු පාලම වැඩසටහනෙන්...



මහරගම වායුසමීකරණ පුහුණුව ලබන සිසුන්



මහරගම රූපලාවන්‍ය පාඨමාලාව හදාරණ සිසුවියන්

තරගකාරීත්වය සහ ජයග්‍රහණය පිළිබඳ හැඟීම් සඳහා දිරි ගැන්වීම

05. තරුණ තරුණියන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් ලබාදීම


06. තරුණ පෙළ අතර සංස්කෘතික, සාහිත්‍යමය සහ කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරිගැන්වීම

07. තරුණ පෙර අතර ශාරීරික ප්‍රාගුණ්‍යය ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම

08. තරුණ පෙළ සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම

09. ආබාධිත තරුණ තරුණියන්ට සහායවීම

10. රාජ්‍යයේ ආර්ථික සැකැස්ම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව දීර්ඝකාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල්



කරාටේ පුහුණුව ලබමින්

ආයෝජනය කිරීමෙත් තරුණ පෙළ සඳහා ක්‍රමික සේවා නියුක්ති අවස්ථා සැලසීම

ප්‍රතිපත්ති සැකසීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී තරුණ පරපුරේ සහභාගිත්වය සඳහා අවස්ථාව ලබාදීම

12. තරුණ සංවිධාන පිහිටුවීම හා තරුණ සුබසාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධානවලට සහාය-වීම

13. තරුණ සේවා ව්‍යාප්තිය සැලසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම

14. එක් එක් තරුණයාගේ ආවේණික ලක්ෂණ වර්ධනය කිරීම

## ජාතික තරුණ මධ්‍යස්ථානය

ජාතික තරුණසේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානය තුළ පිහිටුවා ඇති අතර, ඊට අමතරව දිවයින පුරා පළාත් මට්ටමින් පළාත් කාර්යාල ද, දිස්ත්‍රික් මට්ටමින් සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් කාර්යාලය බැගින් ද දැනට පවත්වා ගෙන යනු ලැබේ. ජාතික තරුණ සේවා සභාවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් භාරව කටයුතු කරන තරුණ සේවා නිලධාරී මහතා සතියේ සෑම බදාදා දිනකම

## යෞවන සේවා බලමුළුව

වත්මන් යෞවන කටයුතු ඇමතිවරයාගේ දර්ශනයක් අනුව ජාතික තරුණසේවා සභාව මගින් ක්‍රියාත්මක කැරෙන අලුත්ම වැඩසටහන යෞවන සේවා බලමුළුවයි. තරුණයින්ගේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා අතදීම එහි අරමුණයි.



**අධ්‍යක්ෂ (සංවර්ධන)**
**ජී. පියතිස්ස මහතා**

දිස්ත්‍රික් මට්ටමින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කැරෙන මෙම වැඩසටහන මගින් දිස්ත්‍රික්කය තුළ තරුණ පිරිස් වලින් අයදුම්පත් කැඳවා ඔවුන්ගේ කැමැත්ත පරිදි ජීවත්වීම සඳහා ආර්ථික සංවර්ධන ක්‍රියාවලියකට යොමුකරන තෙක් අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දීම කැරේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තරුණ තරුණියන් 500 කට මෙම වැඩසටහන තුළින් ප්‍රථම වරට එම අවස්ථාව ලබාදීමට කටයුතු කරන අතර මෙහිදී ජාතික තරුණසේවා සභාව මුල් තැනක් ගනී. උදාහරණයක් වශයෙන් ස්වයංරැකියාවක් කිරීමට කැමැත්තෙන් පසුවන තරුණයෙකුට ඔහුට අවශ්‍ය උපදෙස් ලබාදී ණය පහසුකම් ලබාදී ආදායම් මාර්ගයක් සඳහා සකස්වන තෙක් ඔහුට අතදෙනු ලැබේ.

පෞද්ගලික අංශයේ හැකියාවන් අපේක්ෂා කැරේ නම් ඒ සඳහා සුදුසු ආයතන සහ සාකච්ඡා කර ඊට අවස්ථාවක් සලසා දීම කරනු ලැබේ.

එමෙන්ම ජනාධිපතිනියගේ උපදෙස් අනුව තාක්ෂණය ගමට ගෙනයාම අරමුණු කොට ගනිමින් මොණරාගල අම්පාර මහනුවර පොළොන්නරුව පුත්තලම යන දිස්ත්‍රික්කවල තරුණයින් සඳහා කොළඹ විශ්ව විද්‍යාල පරිගණක තාක්ෂණ ආයතනය (ICT)සමග ඒකාබද්ධව නියමිත ව්‍යාපෘති පහක් ඇරඹීමටත් දැනට රටේ පවතින පරිගණක තාක්ෂණ ශිල්පීන් ගේ හිඟය පිරවීමේ අදහස ඇතිව ගමේ තරුණ තරුණියන්ට ඒ සඳහා අවස්ථාවක් ලබාදීමටත් මේ වසරේ දී කටයුතු කරනු ඇත.

මෙම පාඨමාලාව උසස්පෙළ විෂයන් 3 ක් වත් සමත් තරුණ තරුණියන් සඳහා උපාධිය තෙක් හැදෑරීමට අවස්ථාව සැලසේ.



එරම්ණියාය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සිසුවියන්



උතුරු දකුණු පාලම වැඩසටහනෙන්...

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිය සේවාවල නිරතව සිටී.

මහරගම නගරාසන්නව ස්ථානගත කොට ඇති ජාතික තරුණ මධ්‍යස්ථානය තරුණ කටයුතු පිළිබඳ ආසියාවේ පවත්නා විශාලතම මධ්‍යස්ථානය ලෙස සැලකේ. ජපන් රජයේ පරිත්‍යාගයක් වශයෙන් මැතදී ගොඩනගන ලද මෙම මධ්‍යස්ථානය මගින් තරුණ පෙළ සඳහා වෘත්තීය පුහුණු අවස්ථා වැඩිදියුණු කිරීම, කලා, සංස්කෘතික, ක්‍රීඩා හා නිර්මාණාත්මක අංශයන්ගෙන් හැකියාවන් වැඩි දියුණුකර ගැනිමට අවස්ථා ලබා දෙන ස්ථානයක් ලෙස කටයුතු කිරීම ජාත්‍යන්තර තරුණ මිත්‍රත්වය සහ අවබෝධය පුළුල් කිරීම සඳහා ඉඩකඩ සම්පාදනය යන කරුණු ද, තරුණ පෙළට පුළුල් සමාජමය අවබෝධයක් ලබා දීම ද අරමුණ වී ඇත.

ජාතික තරුණ මධ්‍යස්ථානය වෘත්තීය පුහුණු අංශ ඇතුළත් ගොඩනැගිල්ලකින් ද, රඟහල, ශ්‍රවණාගාරය සහ ගෘහස්ත ක්‍රීඩාංගනය යන අංශ ඇතුළත් බහුකාර්ය ශාලාවකින් ද, රූපවාහිනී චිත්‍රාගාරයකින්, ප්‍රදර්ශනාගාරයකින් සහ පුස්තකාලයකින් ද, 170 දෙනෙකුට ඉඳුම් හිටුම් සපයන නේවාසිකාගාරයකින් ද සමන්විත ය. දිවයිනේ විවිධ ප්‍රදේශවලින් තෝරාගත් තරුණ තරුණියන් සඳහා මෙම මධ්‍යස්ථානයේ දී අර්ධකාලීන සහ පූර්ණකාලීන පුහුණු පාඨමාලා පැවැත් වේ. සෑම වසරකම ජනවාරි සහ ජූලි මාසවල නව පාඨමාලා ආරම්භ කෙරේ. මේ සඳහා අභ්‍යාසලාභීන් තෝරාගනු ලබන්නේ ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීම් පළ කර ඉදිරිපත් වන අපයදුම්කරුවන් විභාග හා සම්මුඛ පරීක්ෂණවලට ලක් කිරීමෙනි. පාඨමාලා සඳහා මුදල් අයකරනු ලැබේ.

## යෞවන සමාජ

ජාතික තරුණ සේවා සභාවේ ක්ෂේත්‍ර මට්ටමේ පවත්නා තරුණ සංවිධාන ඒකකය යෞවන සමාජයයි. තරුණ තරුණියන්ගේ නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම, ජාතිකාභිමානය සහ ආත්මාභිමානය වැඩි දියුණු කිරීමත් අරමුණු කර ගත් යෞවන සමාජවල සාමාජිකත්වය 2001 ජූලි මස අවසානය වන විට 250 000 ක් පමණ විය. යෞවන සමාජ වටා ස්වේච්ඡාවෙන් එක්රොක් වී සිටින තරුණ තරුණියන් ගේ සංඛ්‍යාව මේ ප්‍රමාණය ද ඉක්මවා සිටී.

1979 වසරේ දී නියමු ව්‍යාපෘතියක් ලෙස දිවයිනේ දිස්ත්‍රික්ක දෙකක පමණ යෞවන සමාජ 25 ක් ආරම්භ කරන ලද අතර, එහි සාර්ථකත්වය ඔස්සේ දිවයින පුරා යෞවන සමාජ ව්‍යාප්ත කරන ලදී.


වයස අවුරුදු 17 ත් 29 ත් අතර තරුණ පිරිසට සීමා වූ යෞවන සමාජ කෙරෙහි මෑතදී තරුණ උනන්දුව ශීඝ්‍ර ලෙස වැඩිදියුණු වූයේ එමගින් සමාජ සංර්ධනයට හා පුද්ගල සංවර්ධනයට මහඟු අවස්ථාවක් සැලසෙන බැවිනි.

## ක්‍රීඩා හා විනෝද අංශය


විවිධ ක්‍රීඩාවන් පිළිබඳව තරුණ තරුණියන්ට අවශ්‍ය උපදෙස් සහ පුහුණුව ලබාදීම සඳහා ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රීඩා කඳවුරු සහ ක්‍රීඩා මධ්‍යස්ථාන සංවිධානය කෙරේ. යොවුන් පෙළේ කායික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමත්, ක්‍රීඩා කුසලතා නංවාලීමත් උදෙසා අන්තර් යෞවන සමාජ ක්‍රීඩා තරගාවලිය, ජීවිතාරක්ෂක පුහුණුව, නව ක්‍රීඩා හඳුන්වාදීම, විශේෂ ක්‍රියාකාරකම්, විදේශ කණ්ඩායම් සමග ප්‍රදර්ශන තරග සංවිධානය ආදී විවිධ වැඩසටහන් පැවැත් වේ. මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානය පිහිටුවාලීමත් සමගම දැල්පන්දු, වොලිබෝල්, ටෙනිස්, බැඩ්මින්ටන්, කරාටේ, ජිම්නාස්ටික් යනාදී ක්‍රීඩාවන් සඳහා පුහුණු අවස්ථා වැඩිවීමත් සමගම ක්‍රීඩා පහසුකම් වර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. ජාතික තරුණසේවා සභාවේ කාන්තා හා පිරිමි වොලිබෝල් කණ්ඩායම් සහ නෙට්බෝල් කණ්ඩායම් සඳහා දිවයිනේ ඕනෑම ප්‍රදේශයකින් අයදුම්කරන දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බඳවා ගන්නා අතර, ඔවුනට ඒ ඒ ක්‍රීඩාවන් පිළිබඳව මනා පුහුණුවක් ලාබදීමට කටයුතු යොදා ඇත.

## කාර්මික හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය


ජාතික තරුණ සේවා සභාව මගින් තරුණ පෙළට විවිධ වෘත්තීන්හි පුහුණුව ලබාදීමේ අරමුණෙන් පුහුණු මධ්‍යස්ථානය ආශ්‍රිතව වෘත්තීය පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. මෝටර් කාර්මික, අත්කම්, වඩුවැඩ, මේසන් වැඩ, වැද්දුම්, පැස්සුම්, විදුලි වයරිං, රියදුරු, මැණික්



මඩකලපුව යෞවන සමාජ පුස්තකාලය




මහියංගනය මාපාකඩවැව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය



රිකිල්ලගස්කඩ තුරුණු සවිබලකරණ පුහුණු මධ්‍යස්ථානය



මහරගම පරිගණක පුහුණුව ලබන සිසුන්



පොල්ගොල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

කැපීම, කෘෂිකර්මය, ඇඳුම් කැපීම හා මැසීම, ආහාර සැකසීම, කර්මාන්ත ශාලා මැනුම්, විද්‍යුත් තාක්ෂණය, වොලිබෝල්, දැල්පන්දු හා කබඩි (කාන්තා/පිරිමි) ලියවන පට්ටල් වැඩ, පෙදරේරු, බටහිර සංගීත පුහුණු පාඨමාලා ආදිය ඇතුලුව තවත් විශාල පාඨමාලා ප්‍රමාණයක් මේ අතර වෙයි. මධ්‍යස්ථානවලට අමතරව පුහුණු කටයුතු සඳහා ක්ෂේත්‍ර මට්ටමේ වෙනත් කර්මාන්ත ශාලාද උපයෝගී කරගනු ලැබේ. මීට අමතරව පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිත ගොවිපලවලදී තරුණ පිරිසට ධාන්‍ය වගාව, ගෙවතු වගාව සහ සතුන් ඇතිකිරීම පිළිබඳවද පාඨමාලා පැවැත් වේ.

තරුණ තරුණියන් සඳහා පුහුණු පහසුකම් සැපයීමේ අරමුණින් දිවයිනේ විවිධ ප්‍රදේශවල පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර පවත්වා ගෙන යනු ලැබේ. බොහෝ පුහුණු පාඨමාලා නේවාසිකව පැවැත්වෙන අතර නේවාසික පහසුකම් සහ ආහාර ද අභ්‍යාසලාභීන්ට නොමිලේ සැපයේ. පාඨමාලාව නිමාවේ ඊට අදාළ සහතික පත්‍රයක් ද පිරිනැමීමට කටයුතු යොද ඇත. ප්‍රසිද්ධ පුවත්පත් මගින් අයදුම්පත් කැඳවා පාඨමාලා සඳහා වසරකට දෙවරක් අභ්‍යාසලාභීන් බඳවා ගනු ලැබේ. මධ්‍යස්ථාන පුහුණු පාඨමාලාවලට අතිරේකව තරුණ තරුණියන් සඳහාම වන තවත් පුහුණු පාඨමාලා මැතිවරණ කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කෙරේ. මෙම ත්‍රෛමාසික පාඨමාලාව ජංගම කාන්තා පුහුණුව නමින් හැඳින් වේ. පාසල් අධ්‍යාපනය නිමකරණ තරුණ පිරිසට තමන් සතු කාර්මික හා වෘත්තිමය දක්ෂතා කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පුහුණුව ලබා දී රැකියා අවස්ථාවන්ට යොමු කිරීම සහ නූතන තාක්ෂණික කෘෂිකාර්මික කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ පාඨමාලා මගින් තරුණයින්ට ආර්ථික අසහනය අවම කර ගැනීමට මගපෙන්වීමේ අරමුණ ඇතිව අරඹා ඇති දිවයින පුරා වූ ප්‍රාදේශීය වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන 22 ක් ජාතික මට්ටමේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 04 ක් ද වෙයි.

### ප්‍රාදේශීය වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය

01. ජිනරතන - කොළඹ 02, හෙසියන්තුඩුව, මීරිගම, බුලත්සිංහල, පොල්ගොල්ල, නාඋල, අක්මීමණ, කහව, අකුරැස්ස, එරම්ණියාය, ඇතුන්ගම, කැකිරාව, මොණරාගල, ඔරුබැඳිවැව, මාපාකඩවැව, බටගොල, රත්නපුරය, ඇඹිලිපිටිය, පන්නල, රිකිල්ලගස්කඩ,

### ජාතික මට්ටමේ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන

සපුගස්කන්ද, දඹුල්ල (ස්විස්), එරමිතියාය (ස්විස්), බෙල්වුඩ් මෙම මධ්‍යස්ථානයන්හි වාර්ෂික අර්ධ වාර්ෂික පුහුණු පාඨමාලා සංවිධානය කර ඇත. මීට අමතරව තරුණසේවා සභාවට අනුබද්ධිත වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන දෙහිවල, කොලොන්නාව, අත්තනගල්ල යන ප්‍රදේශයන්හි පැවැත් වේ.

පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිත කෘෂිකාර්මික කටයුතු වලින් (එනම් සත්ව පාලන හා ගොවිපලවල) ආදයමක් ද ලැබේ.

බටගොල, ඇතුන්ගම, හෙසියන්තුඩුව, එරම්ණියාය, බෙල්වුඩ්, පන්නල, ලෙව්වේගොඩ, දඹුල්ල (ස්විස්)එම මධ්‍යස්ථාන අතර වෙයි. 2000 වසරේ දී පමණක් රුපියල් ලක්ෂ අටහමාරක් පමණ ඔවුන් ලාභ ලබා ඇත.

තරුණ පිරිස අතර ඔවුනොවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට ම ව්‍යාපෘති සඳහා පර්යේෂණ කිරීමට අවස්ථාව සැලසීම සහජ දක්ෂතා සෞන්දර්ය කුසලතා සම්පූර්ණ කරගැනීමට ඉඩකඩ ලබාදීම සඳහා පුහුණු කාමර, සාකච්ඡා කාමර, නේවාසිකාගාර, ගෘහස්ථ ක්‍රීඩාගාර, පුස්තකාල, කායවර්ධන ඒකක, රූපලාවන්‍යාගාර, එළිමහන් වේදිකා, ක්‍රීඩාපිටි පහසුකම් සහිත යොවුන් සවිබලකරණ මධ්‍යස්ථාන ගම්පහ දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය, මඩකලපුව දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය, කුරුණෑගල දිස්ත්‍රික්කය, කළුතර දිස්ත්‍රික්කය හා වව්නියාව දිස්ත්‍රික්කයට සපයා ඇත.

දිවයිනේ ගායන සහ නිවේදන අංශයන් යටතේ දක්ෂතාවයන් දක්වන තරුණ තරුණියන් දිස්ත්‍රික් මට්ටමින් ඉදිරියට යැම සඳහා ඉඩකඩ සැලසෙන "තුරුණු ශක්ති තාරුණ්‍යයේ සෞන්දර්ය චාරිකාව රූපවාහිනී සජීවී වැඩසටහන් තුළින් දැනටමත් දක්ෂ ගායන ශිල්පීන් හා නිවේදක ශිල්පීන් ජාතියට හඳුන්වා දී ඇත.

## උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශන අංශය

තරුණ පෙළට මාර්ගෝපදේශනය හා උපදේශනය ලබාදීම තුළින් ආර්ථික හා මානසික අසහනය අවම කිරීමේ අරමුණින් ජාතික තරුණසේවා සභාවේ උපදේශන අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

තරුණ නව නිපැයුම්කරුවන් සඳහා අභිවෘද්ධි වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර, එමගින් නව නිපැයුම්කරුවන් හඳුනා ගැනීම, ඔවුනට නිසි මගපෙන්වීම, පුහුණු පහසුකම් සැලසීම හා මූලාධාර ලබාදීම ද සිදු කෙරේ. නව නිපැයුම්කරුවන්ගේ සමාජය නමින් සංවිධානයක් ආරම්භ කර ඇති අතර, තරුණ නව නිපැයුම්කරුවනට එහි සාමාජිකත්වය ලබා ගැනීමෙන් අදාළ සේවාවන් ලබා ගැනීමට පුළුවන. මීට අමතරව තරුණ පරපුරේ කායික හා මානසික ගැටළුවලට පිළියම් ලාබදීමේ අරමුණින් යොවුන් මිතුරෝ නමින් උපදේශන සේවාවක් ද ක්‍රියාත්මක කෙරේ. මෙම උපදේශන සේවාව නොමිලයේ පවත්වාගෙන යන අතරම උපදෙස් පතා එන අයගේ තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කෙරේ. උපදේශන හා විසඳුම් ලබාදීමට අමතරව වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය අය විශේෂඥ වෛද්‍යවරුන් කරා යොමු කිරීම ද මෙම සේවාව මගින් සිදු කෙරේ. මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානයේ සහ ජාතික තරුණ වෛද්‍ය සභාවේ දිස්ත්‍රික් කාර්යලවල සිටින යොවුන් මිතුරෝ උපදේශන සේවා නිලධාරීන් වෙතින් තරුණ පෙළේ කායික හා මානසික ගැටළු සඳහා උපදේශන සේවා ලබා ගැනීමට පුළුවන.

යොවුන් මිතුරෝ උපදේශන ප්‍රකාශන පළකිරීම, සියදිවි නසා ගැනීම වැලැක්වීමේ සමාජ අනුකූලතාව වැඩමුළු පැවැත්වීම ද, සංඥ භාෂා පාඨමාලාව හා යොවුන් අසපුව පවත්වාගෙන යාමද උපදේශන අංශයේ අනෙකුත් සේවාවන් අතර වේ.

## සංස්කෘතික වැඩසටහන්

ජාතික තරුණ සේවා සභාවේ මෙහෙයවීමෙන් ජාතික මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් සංස්කෘතික වැඩසටහන් රැසක් දැනට ක්‍රියාත්මක



ඔරුබැඳිවැව කාන්තා පුහුණු මධ්‍යස්ථානය



බුලත්සිංහල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

වෙමින් පවතී. තරුණ පෙලේ නිසග කලා කුසලතාවයන් දියුණු කර ගැනීමටත්, එම හැකියාවන් සෙසු ලොවට ඉදිරිපත් කිරීමට අවස්ථා ලබාදීමත් සංස්කෘතික කටයුතුවලදී තරුණ සහභාගිත්වය වැඩි කිරීමත් මෙම වැඩපිළිවෙලේ අරමුණු අතර වේ. වාර්ෂික යෞවන සම්මාන තරගාවලිය මගින් දිවයිනේ තරුණ පිරිසට ස්වකීය කලා සෞන්දර්ය, විද්‍යාත්මක සහ නව සොයා ගැනීම් යන අංශයනට අදාලව සංවිධානය වී ඇති නාට්‍ය, මුද්‍රා නාට්‍ය, සංගීතය, ජන ගී, නැටුම්, මැජික්, රූකඩ, පරිගණක වැඩසටහන් ආදී තරග අංශ යටතේ සමස්ත ලංකා මට්ටමේ තරගයකට මුහුණ දෙමින් හැකියාවන් උරගා බැලීමේ මහගු අවස්ථාවක් උදා වී ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක් ම පාහේ නියෝජනය වන පරිදි විශාල තරුණ පිරිසක් අවුරුදු පතා මෙම තරගාවලියට සහභාගි වෙති. සමහරු ඉන් ලද ජයග්‍රහණයන් හා පෙලඹවීම් ඔස්සේ ඊට අදාලව වෘත්තීය අංශයන් කරා ද සාර්ථකව ලඟා වී සිටිති.

යෞවන සම්මාන තරගාවලියට අදාලව චිත්‍ර මූර්ති හා කැටයම් තරගාවලියක් ද වසරක් පාසා සංවිධානය කෙරේ. ජයග්‍රාහකයනට ලෝකඩ සම්මාන සහතිකපත් හා මුදලින් ත්‍යාග ද පිරිනමනුයේ කලා ක්ෂේත්‍රයෙහිලා ඔවුන් තවදුරටත් දිරිගැන්වීම සඳහා ය.

මීට අමතරව වසරේ ඒ ඒ කාලවලදී යෙදෙන විශේෂ ජාතික හා ආගමික උත්සව ද සංස්කෘතික අංශය යටතේ සංවිධානය කෙරේ. තරුණ පෙලේ කලා කුසලතාවයන් වර්ධනය කර ගැනීමට අතදීමේ අරමුණින් 1980 වසරේ දී ආරම්භ කරන ලද තරුණ සංස්කෘතික කණ්ඩායම් වැඩ පිළිවෙල අද බෙහෙවින් ජනප්‍රියත්වයට පත්ව තිබේ. ඒ ඒ අදාළ කලා අංශයන්හි දක්ෂතා ඇති තරුණ තරුණියන් තෝරා එම පිරිසට මහනුවරට නුදුරු බෙල්වුඩ් කලා නිකේතනයේ දී වසර තුනක නොමිලේ නේවාසික පුහුණුවක් ලබා දෙන අතර, පුහුණු කටයුතු නිමාවේ ලලිතකලාවේදී ඩිප්ලෝමාව ප්‍රදනය කෙරේ. සම්ප්‍රදයික ලලිතකලාවන් හි ද නූතන නැටුම් සහ සංගීත යන අංශයන් හි ද ප්‍රවීණයන් යටතේ මෙම තරුණ කලා කරුවන්ට මනා පුහුණුවක් ලැබෙන පරිදි පාඨමාලාව සංවිධානය කර ඇත.

## විදේශ කටයුතු

ජාතික තරුණ සේවා සභාවේ විදේශ කටයුතු අංශය මගින් රටවල් අතර තරුණ මිත්‍රත්වය හා අවබෝධය පුළුල් කිරීමේ අරමුණින් අන්තර් ජාතික සම්මන්ත්‍රණ, අධ්‍යයන චාරිකා, සුහද දූත ගමන් සහ තරුණ හුවමාරු වැඩසටහන් ද සංවිධානය කෙරේ. මෙම කාර්යයන් නිරතුරුව පවත්වාගෙන යාම සඳහා විදේශ අංශය මගින් ජාත්‍යන්තර සංවිධානය සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි. කැනඩාව, මහා බ්‍රිතාන්‍ය, ඉන්දියාව, ජපානය, ආදී රටවල් සමග තරුණ හුවමාරු වැඩසටහන් පවත්වාගෙන යන අතර, ජාත්‍යන්තර තරුණ සම්මන්ත්‍රණ අධ්‍යයන චාරිකා හා සුහද දූත ගමන් ද සමගින් ජාත්‍යන්තර සංවිධාන සමග මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යනු ලැබේ.

## තොරතුරු කාර්යාංශය

තරුණ පෙලට රැකියා පුහුණු හා අධ්‍යාපනික අවස්ථා පිළිබඳ තොරතුරු සම්පාදනය හා මගපෙන්වීම අරමුණු කරගෙන ජාතික තරුණ සේවා සභාවේ තොරතුරු කාර්යාංශය පවත්වාගෙන යනු ලැබේ.

මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානයේ ස්ථානගත කර ඇති සහස්‍රා මධ්‍යස්ථානය (මිලේනියම් සෙන්ටර්) මගින් තරුණ පෙලට වෘත්තීය, අධ්‍යාපනික පුහුණු අවස්ථා හා රැකියා ඇබෑර්තු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට පුලුවන. රැකියා සපයන ආයතන නියෝජනයට හා රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්ට එකම ස්ථානයකදී මුණගැසීමට අවස්ථාව ලබාදෙන රැකියා වෙළෙඳපොළ වැඩසටහන ද තරුණ උනන්දුව දිනා ගත් වැඩපිළිවෙලක් බවට පත්ව තිබේ. ජාතික මට්ටමේ රැකියා වෙළෙඳ පොලවල් ද සංවිධානය කෙරේ.

උසස් අධ්‍යාපනය ලැබීමට කැමති එහෙත් සරසවි වරම් නොලද තරුණ පිරිස් සඳහා බාහිර උපාධි පරීක්ෂණවලට පෙනී සිටීමේ අවස්ථාව සලසමින් තරුණසේවා සරසවිය නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර සරසවිය මගින් පිරිනමන බාහිර උපාධි සඳහා වන පහත සඳහන් පාඨමාලා සඳහා මේ යටතේ උපාධි අපේක්ෂකයින් ලියාපදිංචි කෙරෙන අතර, ප්‍රාදේශීය මට්ටමින් පංති පැවැත්වීමට කටයුතු යොද ඇත.

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලා

වාණිජවේදී (සාමාන්‍ය) 1 බාහිර උපාධි පාඨමාලාව

විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලනය) බාහිර උපාධි පාඨමාලාව

විද්‍යාවේදී කළමනාකරන (රාජ්‍ය) බාහිර උපාධි පාඨමාලාව

2001 වසරේ තරුණ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවර්ධන පරිපාලනය වියදම් ලෙස ජාතික තරුණසේවා සභාවට එකතු වූ මුදල රුපියල් මිලියන තුන්සිය පනස් හයක් (356) විය.

මීට අමතරව තරුණ සංවර්ධන කටයුතු වලට අභ්‍යන්තර ආදයම් වලින් රුපියල් මිලියන දෙළහක් (12) මුදලක් බලාපොරොත්තු වෙයි. මේ අනුව සමස්ත තරුණ සංවර්ධන කටයුතු වලට රුපියල් මිලියන තුන්සිය හැට අටක් (368) මුදලක් යෙදවීමට නියමිත ය.

2000 වසරේදී ආරම්භ කරන ලද යෞවන කටයුතු අමාත්‍යාංශය පිහිටුවීමත් සමග ජාතික තරුණසේවා සභාවේ තරුණ සංවර්ධන කටයුතු වඩාත් විධිමත්ව කැරෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

වෘත්තීය පුහුණු අංශයෙන් කැරෙන කටයුතු සඳහා තොරතුරු ලබාගැනීම – සහකාර අධ්‍යක්ෂ ජාතික තරුණ මධ්‍යස්ථානය (පුහුණු කිරීම් අංශය) ජාතික තරුණසේවා සභාව, 65, හයිලෙවල්පාර, මහරගම යන ලිපිනයෙන් ලබා ගත හැකි ය. දුරකථන අංකය 850986 යි.

සහකාර අධ්‍යක්ෂ ඇපා උපසේන මහතාගෙන් හා මෙම තොරතුරු ලබා ගැනීමේදී ප්‍රචාරක නිලධාරිනී ශීලා හිඳුරන්ගල මහත්මියගෙන් ලද සහාය කෘතඥපූර්වකව සිහිපත් කරමි. ❑

මහරගම
ටී. බී. සිරිසේන